ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## සුන්දර බිහාරය ශ්‍රී ලංකාවේ දී සැමරේ

කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය පැට්නා හි බිහාර් කෞතුකාගාරය හා එක්ව සුන්දර බිහාරය සැමරීම සඳහා සංවිධානය කර තිබූ සජීවී සැමරුමක් 2025 මාර්තු 22 වන දින කොළඹ හැව්ලොක් සිටි සාප්පු සංකීර්ණයේ දී පැවැත්විණ. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ගැඹුරින් මුල් බැස ගත් සංස්කෘතික බැඳීම් ඉස්මතු කරමින් ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා සහ ශ්‍රීමතී තනුජා ජා මහත්මිය මෙම වැඩසටහන සමාරම්භ කළහ. මෙම වැඩසටහනේදී සහභාගිවන්නන්ට අපූර්ව අත්දැකීමක් ලබා දෙමින් බිහාරයේ කලාව සහ ආහාර සංස්කෘතිය අත්විඳීමේ අවස්ථාවක් හිමි කර දෙන ලදි.

2. බිහාරයේ ප්‍රවීණ කලාකරුවන් දෙදෙනෙකුගේ මධුබානි සිතුවම්හි සජීවී ඉදිරිපත් කිරීම වැඩසටහනේ ඉහළම ආකර්ෂණය හිමිකර ගත් අංගය විය. මධුබානි හි රන්ති ගම්මානයෙන් පැවත එන පද්ම ශ්‍රී දුලාරි දේවි විසින් සියුම් රේඛා සහ අද්විතීය වර්ණ සංයෝජනයන් සහිත සිය කාච්නි ශෛලියේ සිතුවම් සමඟින් පැමිණ සිටි අයට අපූර්ව අත්දැකීමක් ලබා දෙන ලදි. තවත් ප්‍රවීණ කලාකාරිනියක වන පද්ම ශ්‍රී ශාන්ති දේවි විසින් බිහාරයේ කලා සම්ප්‍රදායේ ගැඹුර සහ විවිධත්වය පිළිඹිබු කරමින් අනන්‍ය ගොඩ්නා (පච්ච) ශෛලියේ මිථිලා සිතුවම් ඉදිරිපත් කරන ලදි.

3. සැමරුම තවත් රසවත් කරමින් ලිට්ටි චොඛා, රාම්රුව්, බාරි, සට්ටු පරාතා, ගොයිඩිලා, සක්රෝරි, සට්ටු පානය සහ උත්සව සමයේ ජනප්‍රිය ආහාරයක් වන තේකුවා ඇතුළු බිහාරයේ ප්‍රණීත ආහාර පාන රැසක් ද රස විඳීමේ අවස්ථාව සහභාගී වන්නන්ට හිමි විය. මෙම විවිධාකාර රසයන් ආහාර ලෝලීන් කුල්මත් කළේ අමතක නොවන අත්දැකීමක් ඔවුන්ට ලබා දෙමිනි. ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් රිද්මයානුකූල ජිජියා නර්තනය ඇතුළු බිහාරයේ ජන සම්ප්‍රදායන්ගෙන් පැමිණ සිටි පිරිස අමන්දානන්දයට පත් කළහ.

4. බිහාරයේ ප්‍රසිද්ධ ආගමික ස්ථාන සහ සංස්කෘතික උරුමය පෙන්නුම් කරන ප්‍රදර්ශනයක් ද මෙහිදී පැවැත්විණ. බිහාරයේ විවිධ දිස්ත්‍රික්කවල සාම්ප්‍රදායික අත්කම්

නිර්මාණ ද ප්‍රදර්ශනයට තබා තිබිණ. සුන්දර බිහාරය පිළිබඳ සංස්කෘතික වශයෙන් පූර්ණ අත්දැකීමක් ලබා දෙමින් වැඩසටහන මෛතිලි භාෂාවෙන් පැවැත්විණ.

5. මෙම මාහැඟි උත්සවය කලාකරුවන්, ඉතිහාසය පිළිබඳ උනන්දුවක් දක්වන්නන් සහ ඉන්දියාවේ මිතුරන් රැසක් එකට එක් කළේය. සුන්දර බිහාරයේ වර්ණ, සංගීතය සහ කලාව ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර විචිත්‍රවත් සංස්කෘතික හුවමාරුවකට දායකත්වය ලබා දුන්නේය.

***

**කොළඹ**
***2025*** මාර්තු ***22***